Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

දෙවන වාර පරීක්ෂණය - 2024
இரண்டாம் தவணைப் பரீட்சை - 2024 / Second Term Test - 2024

ශ්‍රේණිය / தரம் / Grade: 10 ශ්‍රේණිය	බුද්ධ ධර්මය - II	කාලය / நேரம் / Time:

නම / பெயர் / Name: ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No.: .....

- පළමු ප්‍රශ්නය ලකුණු 20 ක්ද, අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගින් ද හිමිවේ.
- පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

කෙටි පිළිතුරු ලියන්න.

01. i. සුද්ධෝදන රජතුමා තම පුත් කුමරු කවරෙකු වනු දැකීමට අපේක්ෂා කළේ ද?
ii. සසරෙහි ඉපදීම හේතුවෙන් සියලු සත්ත්වයන්ට මුහුණදීමට සිදුවන ප්‍රධාන දුක් වර්ග දෙකක් ලියන්න.
iii. සංඝ රත්නය ලොව පහළ වූ පෝය දිනය නම් කරන්න.
iv. සිදුහත් බෝසතාණෝ "කිං කුසලගවේසී" ව සිටි සමයේ උන් වහන්සේට හමු වූ සප්ත සමාපත්ති ලාභී තවුසා කවිද?
v. බුදු රජාණන් වහන්සේ "අරහං" නම් වීමට හේතු දෙකක් ලියන්න.
vi. "විසේසේන පස්සතීති විපස්සනා" යන්නහි අර්ථය ලියන්න.
vii. පිරිහීගිය බුදු සසුන නගා සිටුවීම සඳහා වැලිවිට සරණංකර සංඝරාජ හිමි පිහිටුවා ගත් සංවිධානය නම් කරන්න.
viii. සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන පරිදි භෝග විනාශයට හේතුවන කරුණුවලින් දෙකක් ලියන්න.
ix. බුදු දහම පෙන්වා දෙන ප්‍රධාන කුසල මූල තුන කුමක්ද?
x. ත්‍රි ලක්ෂණය නම් කරන්න.

02. i. සිදුහත් කුමරුට ශිල්ප ශාස්ත්‍ර කියා දුන් බමුණු පඩිවරයා නම් කරන්න.
ii. සිදුහත් කුමරු උගත් ශිල්ප ශාස්ත්‍ර තුනක් ලියන්න.
iii. පාසල් ශිෂ්‍යයකුට සිදුහත් කුමරුගේ ළමා කාලයෙන් ලබා ගත හැකි ආදර්ශ විස්තර කරන්න.

03. i. උට්ඨානවතෝ සතිමතෝ යන ගාථාව සම්පූර්ණ කරන්න.
ii. එම ගාථාවේ අර්ථය ලියන්න.
iii. ඉහත ගාථාවේ සඳහන් කරුණු පිළිපදින පුද්ගලයාගේ යසස හෙවත් කීර්තිය වැඩෙන ආකාරය විස්තර කරන්න.

04. i. සිගාලෝවාද සූත්‍රයේ දක්වා ඇති පරිදි මවු පියන් හා ගුරුවරුන් නිරූපණය වන දිසා දෙක පිළිවෙලින් ලියන්න.
ii. දරුවන් විසින් දෙමාපියන්ට ඉටු කළ යුතු යුතුකම් තුනක් ලියන්න.
iii. දෙමාපිය දුදරු යුතුකම් ඉටු කිරීම තුළින් සිදුවන යහපත විස්තර කරන්න.

05. i. විපාක දෙන කාලය අනුව කර්මයේ ප්‍රභේද දෙකක් දක්වන්න.
ii. ඉහත සඳහන් කළ එක් කර්ම ප්‍රභේදයක් කෙටියෙන් හඳුන්වන්න.
iii. කර්මයේ බලපෑම කෙතරම් තීරණාත්මක වුව ද ඇතැම් ඒවා නිවැරදි කර ගැනීමට ද වෙනස් කර ගැනීමට ද හැකි අවස්ථා හතරක් ඇත. ඒ කරුණු හතර විස්තර කරන්න.

06. i. බුදු දහමේ දැක්වෙන ප්‍රධාන භාවනා වර්ග දෙක නම් කරන්න.
ii. භාවනාවට පිවිසෙන තැනැත්තෙකු ඉටු කර ගත යුතු පූර්ව අවශ්‍යතා තුනක් ලියන්න.
iii. සමථ භාවනාව හඳුන්වා එය වැඩීමෙන් ලබා ගත හැකි ප්‍රයෝජන විස්තර කරන්න.

07. පහත සඳහන් මාතෘකාවලින් දෙකකට කෙටිසටහන් ලියන්න.
i. පූජා වැලිවිට අසරණ සරණ සිරි සරණංකරහිමි
ii. භව තණ්හාව
iii. රූප ස්කන්ධය
iv. සඟ ගුණ

Past Papers Wiki

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank